# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2026/27

## සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

### ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්

I. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2000 වසරේ හෝ ඉන්පසු පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයයන් තුනම එකවර සමත් වී තිබීම

**හෝ**

2000 වර්ෂයට පෙර අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිට ඇත්නම් විෂයයන් හතරම එකවර සමත් වී තිබීම

**හෝ**

II. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන භූගෝලීය තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය (**GIS & Remote Sensing)** ඩිප්ලෝමා පාඨමාලාව සමත්වී තිබීම (**SLQF Level 3/NVQ Level 5)**

**හෝ**

**III.** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම **(SLQF Level 3 / NVQ Level 5)**

## පාඨමාලාවේ ගාස්තු

සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ගාස්තු පහත පරිදි වේ.

| ගාස්තුව | මුදල (රුපියල්) | ගෙවිය යුතු කාල සීමාව |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තුව | 15,000.00 | ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතුයි. |
| පාඨමාලා ගාස්තු පළමු වාරිකය | 60,000.00 | පාඨමාලා ගාස්තු පළමු වාරිකය ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතුයි. |
| පාඨමාලා ගාස්තු දෙවන වාරිකය | 75,000.00 | උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ගෙවිය යුතුයි. (විශ්වවිද්‍යාලය මගින් දැනුවත් කරන කාලසීමාව තුලදී ගෙවිය යුතුයි.) |
| පාඨමාලා ගාස්තු තෙවැනි වාරිකය | 45,000.00 | උපාධි II පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ගෙවිය යුතුයි.(විශ්වවිද්‍යාලය මගින් දැනුවත් කරන කාලසීමාව තුලදී ගෙවිය යුතුයි.) |

- ❖ පාඨමාලා ගාස්තු අයකරනුයේ සමස්ත උපාධි පාඨමාලාව සඳහා වන අතර උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර පාඨමාලා ගාස්තු දෙවන වාරික ගෙවීම අනිවාර්ය වන අතර උපාධි II පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර **තෙවැනි වාරිකය** ගෙවිම අනිවාර්ය වේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවකාශය නොලැබේ.

- ❖ ඉහත ගෙවීම්වලට අමතරව සහතික පත්‍ර ගාස්තු සහ උපාධි ප්‍රදානෝත්සව ගාස්තු අදාල පරිදි ගෙවිය යුතුය.

## ලියාපදිංචිය සඳහා තෝරා ගැනීම

භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයකට අනුව, එනම් 200 ට වඩා වැඩි ප්‍රමාණයක් අයදුම් කර ඇත්නම් තෝරා ගැනීමේ පරීක්ෂණයක් හරහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

## උපාධි පාඨමාලාවේ මාධ්‍යය

සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව **සිංහල මාධ්‍යයෙන්** පමණක් හැදෑරිය හැකිය.

## බාහිර උපාධි විවරණිකාව සහ විස්තරාත්මක විෂය නිර්දේශය

2026/27 අධ්‍යයන වර්ෂය සඳහා සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ බාහිර උපාධි පාඨමාලා විවරණිකාව සහ විස්තරාත්මක විෂය නිර්දේශය www.external.sjp.ac.lk යන වෙබ් අඩවියේ පළ කර ඇත.

## විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීම

සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ උපාධි I ,II සහ III කොටස් සඳහා සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය වන පරිදි විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය විසින් මාර්ගගත **(Online)** ක්‍රමවේදය ඔස්සේ දේශන පවත්වනු ලැබේ. එම දේශනවලට සජීවී ලෙස සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර, පසු භාවිතය සඳහා අදාල පටිගතකල දේශන ඉගෙනුම් කළමණාකරන පද්ධතියෙහි **(LMS)** අදාල විෂය යටතේ ප්‍රදර්ශනය කරනු ලැබේ. අවශ්‍ය පරිදි ප්‍රායෝගික විෂය කොටස් සහිත විෂයයන් සඳහා භෞතික වශයෙන් විශ්වවිද්‍යාලය තුළ දේශන පවත්වනු ලැබේ.

## උපාධි පරීක්ෂණ සඳහා පෙනී සිටීම

සම්මන්ත්‍රණ අවසන් වූ පසු පරීක්ෂණ සඳහා www.external.sjp.ac.lk **වෙබ් අඩවිය ඔස්සේ පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ. පාඨමාලා ගාස්තු නියමිත පරිදි ගෙවා පරීක්ෂණට අයදුම් කළ අයට පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

**** පාඨමාලා ගාස්තු වාරික ගෙවීම්, සම්මන්ත්‍රණ කාලසටහන්, විභාග කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර ඇතුලු සියලුම විස්තර www.external.sjp.ac.lk වෙබ් අඩවිය ඔස්සේ පමණක් නිකුත් කෙරේ.**

**ඒ අනුව www.external.sjp.ac.lk වෙබ් අඩවිය පරිශීලනය කිරීම අත්‍යාවශ්‍ය වන අතර කිසිදු දැනුම් දීමක් තැපැල් ලිපි මඟින් එවනු නොලැබේ.**

## ලියාපදිංචිය අවලංගු කිරීම

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමඟ ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචිය අවලංගු කිරීමේදී මුදල් නැවත ගෙවීමක් සිදු කරනු ලබන්නේ පහත සදහන් හේතුන් වලට පමණි.

01. **ලියාපදිංචි වු දින සිට සති දෙකක් ඇතුළත කරනු ලබන ඉල්ලීම්** සඳහා පමණක් ගෙවන ලද ලියාපදිංචි ගාස්තුව (රු.15,000) හැර පාඨමාලා ගාස්තු මුදලින් **10%** ක්

රඳවා ගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ. මෙම කාලසීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

02. යම් අයකු බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වී **ප්‍රථම වසර පරීක්ෂණය පැවැත්වීමට පෙර රාජ්‍ය විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් ලියාපදිංචි වුවහොත්** ගෙවන ලද ලියාපදිංචි ගාස්තුව (රු.15,000) හැර පාඨමාලා ගාස්තුවෙන් **10%** ක් රඳවා ගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ.

## <u>අයදුම්පත් යොමු කිරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු</u>

01. අයදුම්පත් යොමු කළ හැක්කේ මාර්ගගත ක්‍රමවේදය **(Online)** ඔස්සේ පමණි. ඒ අනුව **www.external.sjp.ac.lk** වෙබ් අඩවියට පිවිස නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ **(Submit)** යුතුය. මාර්ගගත **(Online)** ක්‍රමවේදය ඔස්සේ අයදුම්කරන ලද උපාධි පාඨමාලාව ඉන් පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

02. අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත කළ යුතුය.

   i. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්.
   ii. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්.
   iii. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්.
   iv. බැංකුවට ගෙවන ලද **රු. 3000/-** මුදලට අදාල රිසිට්පතේ මුල් පිටපත හෝ **VISA හෝ Master (debit/ credit**) කාඩ්පත් මගින් ගෙවීම් කරන්නේ නම් ගෙවීම් කල බව තහවුරු කිරීමේ මුද්‍රිත සාක්ෂි සටහනක් **(Online receipt)**

03. ඉහත සඳහන් ලේඛනවල පිටපත් සමඟ සම්පූර්ණ කරන ලද අයදුම්පත **(Hard copy)** පහත සඳහන් ලිපිනයට 2026-08-10 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**(සැ. යු. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කර එවිය යුතුය.)**

අයදුම්පත යොමු කළ යුතු ලිපිනය ඃ

**සහකාර ලේඛකාධිකාරී**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**අංක 16, එස්. ඩී. එස්. ජයසිංහ මාවත**
**කොහුවල**
**නුගේගොඩ**

04. ඔබ විසින් සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි **පාඨමාලාවට අදාළ ගිණුම් අංකයට 072010007069 පමණක් බැර වන පරිදි** දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම හෝ ඕනෑම VISA හෝ Master (debit/ credit) කාඩ්පත් මඟින් **රු. 3000/-** මුදලක් (ආපසු නොගෙවන) ගෙවා ලබා ගත් රිසිට් පත අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. **ඔබ ඉල්ලුම් කිරීමට අපේක්ෂිත බාහිර උපාධි පාඨමාලාවේ ගිණුම් අංකයට පමණක් මුදල් ගෙවීම අනිවාර්ය වේ** **(බැංකු රිසිට්පතේ ඡායා පිටපතක් සහ ඔබ** VISA හෝ Master (debit/ credit) **කාඩ්පත් මඟින් ගෙවීම් කරන්නේ නම්** ගෙවීම් කල බව තහවුරු කිරීමේ මුද්‍රිත සාක්ෂි සටහනක් (Online receipt) ළඟ තබා ගත යුතුවේ.

05. අධ්‍යාපන සුදුසුකම් යටතේ අ.පො.ස (උ/පෙළ) සහතිකය පිළිගනු ලබන්නේ පහත සඳහන් එක් ක්‍රමයක් යටතේ ඉදිරිපත් කළහොත් පමණි. තවද එම සහතිකයේ Z අගය පැහැදිලිව සඳහන් වීම අනිවාර්ය වේ.

- පාසල් අයදුම්කරුවන් -අන්තර්ජාලය මඟින් ලබාගත් ප්‍රතිඵල ලේඛනයේ **පාසලේ විදුහල්පති සහතික කරන ලද** පිටපත හෝ විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද **මුල් සහතිකයේ** සහතික කරන ලද පිටපත

- පෞද්ගලික අයදුම්කරුවන් - විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද **මුල් සහතිකයේ** සහතික කරන ලද පිටපත (අන්තර්ජාලයෙන් ලබාගත් පිටපත් පිළිගනු නොලැබේ)

06. අයදුම්පත සමඟ අධ්‍යාපන සහතිකවල සහ අදාල වෙනත් ලේඛනවල සහතික කළ පිටපත් පමණක් එවිය යුතුය. (මුල් පිටපත් එවීම අවශ්‍ය නොවේ.)

07. අන්තර්ජාලය මඟින් ලබාගත් ප්‍රතිඵල ලේඛනය හැර අනෙකුත් අධ්‍යාපන සහතික සහ ලේඛනවල පිටපත් සහතික කළ යුත්තේ **රජයේ හෝ අනුමත කළ පාසලක ප්‍රධානියෙකු/ විශ්වවිද්‍යාල ආචාර්යවරයකු /රජයේ දෙපාර්තුමේන්තුවක හෝ සංස්ථාපිත ආයතනයක විධායක නිලධාරියකු/ නීතීඥවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ ග්‍රාම නිලධාරිවරයකු** විසිනි. එකී පිටපත්වල සහතික කරන නිලධාරියාගේ අත්සන සහ නිලමුද්‍රාව තිබීම අනිවාර්ය වේ.

**<u>අයදුම්කරුවන් සඳහා උපදෙස් ඃ</u>**

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- එක් අයදුම්කරුවකුට උපාධි පාඨමාලා කිහිපයකට අයදුම් කළ හැකිය. ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතු අතර අදාළ ගෙවීම් ද වෙන් වෙන් වශයෙන් අදාළ ගිණුම් අංකවලට ගෙවිය යුතුය. අදාළ නිර්ණායක සම්පූර්ණ කළ පසු එක් අයදුම්කරුවෙකුට ලියාපදිංචි විය හැක්කේ එක් බාහිර උපාධි පාඨමාලාවකට පමණි.

- එක් එක් උපාධි පාඨමාලාවන්ට නියමිත ගිණුම් අංකයට ගෙවීම් සිදු නොකර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

***** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට අනුබද්ධ කිසිදු නියෝජිත ආයතනයක් නොමැත. එබැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා [www.external.sjp.ac.lk](http://www.external.sjp.ac.lk) යන වෙබ් අඩවියට පිවිස උක්ත සඳහන් ක්‍රමවේදය පමණක් අනුගමනය කළ යුතුය. වෙනත් නියෝජිතායතන හරහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.***

සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2026-07-28